ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව
අඛණ්ඩ ඇගයුම් පරීක්ෂණය 1 - 2023/2024
පස්වන මට්ටම
පරිසර නීතිය - LLU 5811
කාලය – පැය එකයි

**දිනය: 07.11.2024** වේලාව: ප.ව. **1.30 p.m. -2.30**

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

**සියලු ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න.**

'ෆෝරම් ෆෝ ග්‍රාස්රූට්ස්' යනු පර්ල් නමැති රටේ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධානයකි. පහත දැක්වෙන්නේ, එම සංවිධානයේ වාර්තාවකින් උපුටා ගත් කොටසකි ;

පර්ල් දේශය 2022 වර්ෂයේ දී එහි ඉතිහාසයේ බරපතලම ආර්ථික අර්බුදයට මුහුණ පැවේය. 'කෘෂිකාර්මික' රටක් ලෙස සලකනු ලැබුවත්, පර්ල් දේශය විශාල වශයෙන් ආහාර ආනයනය මත රැඳී සිටි රටකි. මෙම පසුබිම තුල, 2023 ආරම්භයේ දී, එක්ස් ෂුගර් කේන් (පෞද්ගලික) සමාගම රටේ නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි පක්කරෙයිපත්තු හි අක්කර 10,000 ක් ආවරණය වන ලෙසට, උක් දඩු වගා කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයෙන් යුක්ත ව්‍යාපාරයක් ආරම්භ කළේය. හවුල්කාරිත්ව ගිවිසුම අනුව, සමාගමේ අයිතියේ සියයට 51 ක් රජය සතු වූ අතර, සියයට 49 ක් එක්ස් ෂුගර් කේන් (පෞද්ගලික) සමාගම වෙත විය. මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය ජල මූලාශ්‍රවලින් ජලය ලබාගැනීම සඳහා බලපත්‍රයක් සමාගම ලබාගත්තේය.

පසුගිය මාසයේ දී, පක්කරෙයිපත්තු හි ජනතාව තමුන්ගේ ලිං සිඳී යන බවත්, භාවිතයට හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රමාණවත් ජලය නොමැති බවටත් පැමිණිලි කරමින්, උද්ඝෝෂණ කීපයක් පැවැත්වූහ. තම ගම හා උක් දඬු වගා කළ බිම් පෙදෙස අතර පැවැති ගංගාව දූෂිත තත්වයට පත්ව තිබෙන බවත්, එහි වූ මත්ස්‍යයන් මියැදෙන බවටත් ඔවුහු වැඩිදුරටත් පැමිණිලි කළහ. මෙම චෝදනා සනාථ කරන වෛද්‍ය විද්‍යාත්මක හා විද්‍යාත්මක සාක්ෂි මානව හිමිකම් ක්‍රියාකාරීන් විසින් අනාවරණය කරගන්නා ලදී. අභ්‍යන්තර හා බාහිර සංක්‍රමණය තුලින්, වෙනත් රැකියා සොයා ප්‍රදේශයේ ගොවි ජනයා පිටව යන්නට වූහ. ගොවීන් කිහිප දෙනෙක් බැංකුවලට අධික ලෙස ණයගැති වී සිටියහ. වගා කටයුතු සඳහා වූ වියදම් පියවා

ගැනීම පිණිස ඔවුන් සිය රණ් භාණ්ඩ උකස් කොට තිබුණි. පසුගිය මාස හතර තුල, ගොවීන් හත් දෙනෙක් සිය දිවි නසාගෙන ඇත.

පර්ල් දේශයේ නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන බව උපකල්පනය කරමින්, පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල නඩු තීන්දු නීතිය උපුටා දක්වමින් ඔබගේ පිළිතුර සනාථ කළ යුතුය.

(අ) උක් දඩු වගාව සිදු කරගෙන යාම තුල, රජය පරිසර නීතියේ මූලධර්ම උල්ලංඝණය කරන බවට නඩු පැවරීමට දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් සැලසුම් කරයි. මෙහිදී අදාල වන මූලධර්ම හඳුනාගෙන, අදාල සංවිධානයට මෙම තර්කය ගොඩනැගිය හැක්කේ කෙසේද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ) තම සත් හැවිරිදි දියණිය වෙනුවෙන්, ප්‍රදේශයේ පාසල් ගුරුවරියක් නඩු පැවරීමට අපේක්ෂා කරයි. ඒ ඇයගේ දියණියට සෞඛ්‍යය සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සඳහා වූ අයිතිය උල්ලංඝණය වූ බවට වන පදනම මතය. ඇයට වලංගු තර්කයක් ඉදිරිපත් කළ හැකිද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ඔබගේ පිළිතුර ලංකාවේ හා වෙනත් නීති පද්ධතිවල, අදාල ව්‍යවස්ථාපිත නීතිය හා නඩු නීතිය ඇසුරින් තහවුරු කළ යුතුය.

***නිමිකම් ඇවිරිණි***